# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2024.12.19 පැය 0930 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 1865 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.12.19 වන දින අළුයම් කාලයේදී මොරගහහේන පොලිස් වසමේ කුඩා උඩුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 840 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොරගහහේන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු ඩුබායි රාජ්‍යයේ සැඟව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු හා සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මත්ද්‍රව්‍ය ජාලය මෙරට සිට මෙහෙයවනු ලබන පුද්ගලයෙකු බවත්, ඔහු සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගත් වාහන වලට සවි කිරීම සඳහා ව්‍යාජ ලෙස සකස් කරන ලද අංක තහඩු 04ක් සොයා ගෙන ඇති අතර එම අංක තහඩු වලට අදාල වාහන නොමැති බවට හා එම අංක තහඩු වෙනත් වාහනයකට සවිකර කූඨ ලෙස කල්බදු ණය පහසුකම් ලබා ගෙන ඇති බවටත් අනාවරණය වී ඇත.

පොලිස් විශේෂ කාර්ය බලකාය හා මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. කේරළ ගංජා සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.12.18 වන දින දහවල් කාලයේදී කොට්ටාව පොලිස් වසමේ හෝකන්දර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 65 ග්‍රෑම් 480 ක් හා එම ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් ලක්ෂ 05 කට ආසන්න මුදලක් සමග** සැකකාරියක් අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 47 ක් වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

ඉහත වැටලීමට අදාල ඡායාරූප කිහිපයක්









**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**